දේවි බාලිකා විද්‍යාලයේ අතිරේක අංශයක් නුගේගොඩ පිහිටුවීමේ රජයේ යෝජනාව සහ ඊට නැගෙන විරෝධතාවය සම්බන්ධ ගැටළුව මාධ්‍ය තුළ මේ වනවිට පුළුල්ව සාකච්ඡා වෙමින් තිබේ. කෙසේ නමුත් ඒ පිළිබඳව අපගේ අවධානයට ලක්වූ එක් පුවත්පත් ලිපියක් තුළ, දෝෂදර්ශනයට ලක්වූ ඇතැම් පාර්ශවයන් වෙත පදනම් විරහිත ලේබල් ගැසීම් සිදුකර ඇති බව නිරීක්ෂණය කරන්නට හැකි විණි.
ඒ, "දේවි බාලිකා ඉඩම බිස්නස්කාරයෙකුට, විශේෂ අනාවරණයක්..." යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහය තුළ (05/09) වූ මත දැක්වීමේ ලිපියක් තුළය. මෙම ලිපිය තුළ විවේචනයට පාත්‍රව තිබූ පුද්ගලයෙකු සම්බන්ධයෙන් සඳහන්ව තිබුණේ ඇය "නොම්බර එකේ එන්.ජී.ඕ. කාක්කියක" ලෙසිනි!
මෙවැනි සඳහන් කිරීම් සැබවින්ම පුද්ගලයින්ව ගර්හාත්මකව ලේබල් ගත කිරීම් සහ පුද්ගලික ප්‍රහාර නොවන්නේද? එවැනි ලේබල් ගත කිරීම් සඳහා ඇති පදනම කුමක්ද? අදාළ පුද්ගලයන් සම්බන්ධයෙන් යම් චෝදනා තිබේ නම්, සාක්ෂි සාධක සහිතව එම චෝදනා ඉදිරිපත් කරනු විනා, මෙසේ පදනමක් ඉදිරිපත් නොකරමින් ඔවුන්ව ගර්හාත්මකව ලේබල්ගත කිරීම් මාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැණි නොවේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina